උසස් පෙළ සඳහා ඔබ තර්ක ශාස්ත්‍රය විෂය තෝරාගත යුත්තේ ඇයි ?

(1) තොරතුරු තාක්ෂණය, නීති විද්‍යාව, ආර්ථික විද්‍යාව, සමාජ විද්‍යාව, දේශපාලන විද්‍යාව, සංඛ්‍යාන විද්‍යාව, ගණිතය යන විෂයයන්ගේ සංකලනයක් ලෙස තර්ක ශාස්ත්‍රය දැක්විය හැකිය. ඒ නිසා තර්ක ශාස්ත්‍රය හැදෑරීම තුළින් ඔබට විෂයයන් ගණනාවක දැනුම ලැබේ.

(2) අ.පො.ස. (උසස් පෙළ) සඳහා නිකුත් කර තිබෙන 2009/16 යන චක්‍රලේඛයට අනුව කලා විෂය ධාරාව යටතේ තර්ක ශාස්ත්‍රය අනිවාර්ය විෂයයන්ගෙන් එකක් වීම. මෙම 2009/16 චක්‍රලේඛයට අයත් විෂයයන්ගෙන් අඩු වශයෙන් එක් විෂයයක්වත් හැදෑරිය යුතුය. අවශ්‍ය නම් මෙම කාණ්ඩයෙන් විෂයයන් තුනම වුවද තෝරා ගත හැකිය. මෙම කාණ්ඩයට අයත් වන්නේ තර්ක ශාස්ත්‍රය, දේශපාලන විද්‍යාව, ආර්ථික විද්‍යාව, භූගෝල විද්‍යාව, ඉතිහාසය, තාක්ෂණවේදය වැනි විෂයයන්ය.

(3) වාණිජ්‍ය විෂය ධාරාව සඳහාද තෝරා ගත හැකි වීම. නව චක්‍රලේඛයට අනුව වාණිජ්‍ය විෂය ධාරාව හැදෑරීමට බලාපොරොත්තු වන සිසුන් පහත සඳහන් විෂයයන් අතරින් අවම වශයෙන් විෂයයන් දෙකක් තෝරා ගත යුතුය.

1. ගිණුම්කරණ 2. ව්‍යාපාර අධ්‍යයනය 3. ආර්ථික විද්‍යාව ඉතිරි විෂයය පහත දැක්වෙන විෂයයන් අතරින් තෝරා ගත යුතුය.

| | | | |
|---|---|---|---|
| 01. | තර්ක ශාස්ත්‍රය හා විද්‍යාත්මක ක්‍රමය | 07. | ජර්මන් |
| 02. | ව්‍යාපාර අධ්‍යයනය | 08. | ප්‍රංශය |
| 03. | භූගෝල විද්‍යාව | 09. | කෘෂි විද්‍යාව |
| 04. | දේශපාලන විද්‍යාව | 10. | සංයුක්ත ගණිතය |
| 05. | ඉතිහාසය | 11. | තොරතුරු තාක්ෂණය හා සන්නිවේදන තාක්ෂණය |
| 06. | ඉංග්‍රීසි | | |

(4) නීතිය හැදෑරීමේදී වැදගත් වීම
නීති විද්‍යාලයට අදාල සංකල්ප ගණනාවක්ම තර්ක ශාස්ත්‍රයේ නව විෂය නිර්දේශයට ඇතුළත් වේ.